# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## නඩත්තු කාර්මික ශිල්පී-ජෙනරේටර් කාර්මික (නේවාසික) [ස්ත්‍රී/පුරුෂ]

කොළඹ ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමණාකරණ කාර්යාලය සඳහා නඩත්තු කාර්මික ශිල්පී/ ජෙනරේටර් තනතුරට සුදුසුකම් ලත් අයදුම් කරුවන්/කාරිනියන් බඳවා ගනු ලැබේ.

**ස්ත්‍රී සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු. ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතීත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි. ඔබගේ මනුෂ්‍යත්වය සහ යහපත්කම යන ගතිගුණ අපි ඉතා අගය කොට සලකමු. අන් ලාංකිකයන්ට වඩා, ඔබගේ මනාව වැඩ කිරීමේ හැකියාව අපගේ අපේක්ෂාවයි. මේ සඳහා ඔබගේ ලිංගික සම්භවය, ආගමික සම්භවය හෝ දේශපාලන අභිමතය නොසලකමු.**

මෙම තනතුර දරන්නා නේවාසික පහසුකම් ඉංජිනේරුවරයා වෙත සෘජුවම වාර්තා කළ යුතු ය. මෙම තනතුර දරන්නා තානාපති කාර්යාලයේ නේවාසික හිමිකාරිත්වය/කල්බදු අයිතිය සහිත අදාළ දේපළ පරිශ්‍රයන්හි ප්‍රධාන හා හදිසියක දී පාවිච්චි කරනු ලබන ජෙනරේටර්වල නඩත්තුව සහ අලුත්වැඩියා කටයුතු සිදුකළ යුතු ය. මීට අමතරව, ගෝලීය නඩත්තු කළමණාකරණ පද්ධතිය (GMMS) විසින් ජනනය කරන ලද සැලසුම් කළ/නොකළ සහ වළක්වා ගැනීමේ නඩත්තු සඳහා වූ සේවා නියෝග සඳහා ප්‍රතිචාර දැක්වීම ද සිදුකළ යුතු වේ.

**පූර්ණ කාලීනව සතියකට පැය 40ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප ඇමෙරිකානු ඩොලර් 464 කි.**

කාර්යමණ්ඩල වේතන ඇමෙරිකානු ඩොලර් මගින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2023 මාර්තු 22 වනදා වන විට විනිමය අනුපාතය ඇ.ඩො.1 = රු. 319.50 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.

**සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:**

1. **අධ්‍යාපන** - ද්විතීයික අධ්‍යාපනය සම්පූර්ණ කර තිබිය යුතු ය. *(අ.පො.ස සාමාන්‍ය පෙළ පරීක්ෂණය සම්පූර්ණ කර තිබීම. ගණිතය විෂය ඇතුළුව විෂයයන් 6 ක් සමත් ව තිබිය යුතු අතර අවම වශයෙන් විෂයයන් 3ක් සඳහා විශිෂ්ට සාමාර්ථ හෝ සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතු ය.)* එසේම ඩීසල් එන්ජින් විදුලි උත්පාදන කාර්මික ශිල්පීන් සඳහා වූ පිළිගත් ආයතනයකින් සාර්ථකව නිම කරන ලද වෘත්තීය පුහුණු පාඨමාලාවක් තිබිය යුතු ය. **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය).**

2. **පූර්ව රැකියා පළපුරුද්ද** - වාණිජ දේපළවල, එනම් උස තට්ටු ගොඩනැගිලිවල, ආරෝග්‍ය ශාලාවන්හි, විද්‍යාලයන් හෝ සරසවිවල, නේවාසික/තට්ටු නිවාසවල නැතහොත් දේශීය උපයෝගිතා සමාගම් වෙනුවෙන් ප්‍රධාන හෝ හදිසි අවස්ථාවල භාවිතා කරන ජෙනරේටර් ක්‍රියාත්මක කරවීම, නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු පිළිබඳ **අවම වශයෙන් වසර 3ක පළපුරුද්ද** තිබිය යුතු අතර ඉන් වසරක කාලයක් 45 KVA හෝ විශාල ජෙනරේටර්වල මෙහෙයුම්, නඩත්තු හා අලුත් වැඩියා කිරීමේ කටයුතුවල නිරත වී තිබිය යුතු ය. **(අදාළ සේවා ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය).**

3. **භාෂා ප්‍රවීණතාවය** - II වන මට්ටමේ (සීමිත දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. **(මෙය පරීක්ෂා කරනු ලැබේ).**
   එසේම III වන මට්ටමේ (මනා කාර්යස්ථ දැනුම) සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4. **නිපුණතා සහ හැකියාවන්** - මනා රිය ධාවන වාර්තාවක් සහිත "B" පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් C, C1 කාණ්ඩ) තිබිය යුතු ය. **(සුරක්ෂිතව රිය පැදවීමේ හැකියාව පරීක්ෂා කළ හැක). (රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතුය).**

**අයදුම් කරන ආකාරය :**

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවාගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**අවශ්‍ය ලේඛන:**

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.** එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා/කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)
- අදාළ රියදුරු බලපත්‍රය (පැති දෙකම)

**තැපැල් හෝ විද්‍යුත් මගින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2023 **අප්‍රේල්** 14 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.